# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1728/13 - 2011 ඔක්තෝබර් 19 වැනි බදාදා - 2011.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

217 වැනි වගන්තිය යටතේ නිවේදනය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 217 වැනි වගන්තිය යටතේ (විශ්‍රාම වැටුප්, අර්ථ සාධක, පාරිතෝෂික හෝ ඉතුරුම් අරමුදල් සම්බන්ධයෙන් "කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද" යන අර්ථ දැක්වීමට අදාලව) මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් කන්දෙ මොහොට්ටාලලාගේ සුනිල් කන්දෙගෙදර වන මම 2011 මැයි මස 06 වැනි දින දරන අංක 1704/18 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නියෝගයේ "උපලේඛනයේ " (2) අයිතමයේ (i) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීම මගින් මෙම නියෝගයෙන් සංශෝධනය කරමි.

"(i) අවම වශයෙන් අරමුදලේ මුදල් වලින් 40%ක් ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හෝ රජයේ සුරැකුම් පත්වල තැන්පතු ස්වරූපයෙන් ආයෝජනය කර තිබිය යුතු ය.".

කන්දෙ මොහොට්ටාලලාගේ සුනිල් කන්දෙගෙදර,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2011 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

11-103

1A - G 15177— 1865 (2011/10)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.